## ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - 2017

-----------------------------------------

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරිත්ව වාර්තාව, ස්කන්ධය වෙනස්වීමේ වාර්තාව සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය, 1996 අංක 26 දරන බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ සහ 2012 අංක 15 දරන ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 46 වගන්තිය සමග සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායන් වහන්සේ වෙත 2018 ජූලි 19 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000–1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 මතය

---

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මාණ්ඩලික නිලධාරීන්ට පමණක් උපරිමය රු.100,000 කට යටත්ව අත්තිකාරම් ලබාදිය හැකි වුවද, අවස්ථා 3 කදී එහි සීමාව ඉක්මවා එකතුව රු.605,430 ක අත්තිකාරම් ලබාදී තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරුන් ලෙස සේවය කරන ලද රජයේ නිලධාරීන් දෙදෙනෙකු වෙත ගෙවා තිබුණු දීමනා වලින් ආයතන සංග්‍රහයේ IX පරිච්ඡේදයේ 2.2 ඡේදය ප්‍රකාරව රු.21,900 ක් වූ සියයට 10 ක රාජ්‍ය භාගය අඩු නොකොට මුළු මුදලම අදාළ පාර්ශවයන්ට ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.48,834,341 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.52,229,436 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රථිඵලයේ රු.3,395,095 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ පුද්ගලික පඩිනඩි රු.16,944,896 කින් හා ස්ථාවර වත්කම් ක්ෂය රු.5,977,834 කින් වැඩි වුවද පුනරාවර්තන ප්‍රදාන රු. 28,663,000 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන ලෙස හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට අඛණ්ඩව ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා දේපළ පිරියත හා උපකරණ සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු.79,634,474 ක්වූ විශ්වවිද්‍යාලයේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.184,277,425 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි. .

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්යසාධනය

---

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා හඳුන්වා දී තිබුණු අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වූ අධ්‍යයන කටයුතු පිළිබඳ වගවීම් පරිචය (Code of practices on academic accountability for academy staff in Sri Lankan University System) අනුව ඉටු කළයුතු අධ්‍යයන කටයුතුවල සම්මත ප්‍රමාණයන් (Work norms) හෝ භික්ෂු විශ්වවිද්‍යාලය විසින් ඉහත කී මහ

පෙන්වීම්වලට අනුව සාදා ගන්නා ලද ක්‍රම වේදයක් හෝ අධ්‍යයන කාර්ය සාධනය ඇගයීම සඳහා ක්‍රියාත්මක නොකර කාලසටහන් පමණක් භාවිතා කර තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් විමර්ශන අංශයෙන් හා බැහැර දීමේ අංශයෙන් ලබාගන්නා ලද පොත් 64 ක් ආපසු භාරදීමේ කාලසීමාව ඉක්මවා වසර 2 සිට වසර 15 දක්වා වූ කාලයක් ගතවී තිබුණි. එම පොත් ආපසු පුස්තකාලයට ලබාගැනීමට සහ ඒවා ආපසු භාර නොදීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කළමනාකරණ මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 ඔක්තෝබර් 04 දිනැති අංක 15/2016 දරන කොමිෂන් සභා චක්‍රලේඛය මගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් හඳුන්වා දී තිබුණු බඳවාගැනීමේ පරිපාටියට අනුකූල නොවන ලෙස කළමනාකරණ සහකාර තනතුරු 9 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළ පත්වීම් ලබාදී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.2.3 ඡේදය අනුව නේවාසිකාගාර සඳහා ආර්ථික කුලිය, එහි පදිංචි සෑම නිලධාරියෙකුගෙන්ම එක හා සමාන කොටස් වලින් අයකරගත යුතු අතර 5.8 ඡේදය අනුව ජලය සහ විදුලිය සඳහා වියදම පදිංචිකරුවන් විසින් දැරිය යුතුය.නේවාසිකාගාර පරිහරණය කරන කථිකාචාර්යවරුන් 27 දෙනෙකු සිටි අතර කාමර කුලිය, ජලය සහ විදුලිය වෙනුවෙන් එක් අයෙකුගෙන් රු.500 ක මාසික ගාස්තුවක් බැගින් පමණක් අයකරගෙන තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය සඳහා එම නේවාසිකාගාර වෙනුවෙන් ජල බිල්පත් සඳහා රු.646,622 ක් ද, විදුලි බිල්පත් සඳහා රු.547,383 ක්ද විශ්වවිද්‍යාල අරමුදලින් දරා තිබුණි.

(ඈ) බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදල සඳහා වන අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව සේවක අර්ථසාධක අරමුදලට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කලයුතු වුවත් එලෙස මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර අරමුදලේ පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) 2016 වර්ෂය තුළ රු.298,243,258 ක් වියදම් දරා ඉදිකර තිබූ තෙමහල් පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම පිළිබඳ අධීක්ෂණ කටයුතු භාර ඉංජිනේරුවරයා විසින් ඉටු නොකළ වැඩ සහ අනුමත නොවූ වැඩ සඳහා ගෙවීම් නිර්දේශ කිරීම හේතුවෙන් ඉහත සඳහන් මුළු මුදලම ගෙවා තිබුණි. විගණනයෙන් මෙම කරුණු පෙන්වා දීමෙන් අනතුරුව කළමනාකරණය විසින් ගනු ලැබූ විවිධ ක්‍රියාමාර්ග වලින් පසුව රු.1,896,822 ක වැඩ කොටස් නිවැරදි කර තිබුණු අතර, ඉටු නොකළ වැඩ වෙනුවෙන් කොන්ත්‍රාත්කරුගෙන් රු.5,058,990 ක් අයකර තිබුණි. නමුත්, සාවද්‍ය ගෙවීම් නිර්දේශ කරනු ලැබූ නිලධාරීන් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් විගණන දිනය වූ 2018 ජූලි 30 දින වන විටත් ගෙන නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 28 වන දින මිලදී ගෙන තිබුණු රු.638,000ක් වටිනා ක්‍රීඩා උපකරණ විගණන දිනය වූ 2018 ජූනි 12 දින වන විටත් බෙදා හැර නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව ස්වයං උත්පාදිත අරමුදල් මගින් පවත්වාගෙන යන පාඨමාලා සඳහා පිළියෙල කල යුතු අයවැය ලේඛනයෙහි සෘජු හා වක්‍ර පිරිවැය වෙන වෙනම හඳුනාගත හැකි පරිදි පාඨමාලාවල අයවැය පිළියෙල කළයුතු විය. එසේම එම චක්‍රලේඛයේ 5.2.3. ඡේදය ප්‍රකාරව ස්වයං උත්පාදිත පාඨමාලාවල අධ්‍යයන නොවන කාර්ය මණ්ඩලයට වෙන් කළ හැකි උපරිම මුදල මුළු වක්‍ර පිරිවැයෙන් සියයට 10 ක ප්‍රමාණයට සීමා කළයුතු බව දක්වා තිබුණි. භික්ෂු විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළදී ස්වයං උත්පාදිත ක්‍රියාකාරකම් යටතේ ඇති කරන ලද පාඨමාලා 03 ක් වෙනුවෙන් පිළියෙල කර තිබූ අයවැය ලේඛන වල එම සීමාව ඉක්මවා සියයට 33 ක් දක්වා එනම් රු.907,000 ක් වෙන් කර මුදල් කමිටුවේ අනුමැතිය මත ගෙවීම් කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයට දෙමහල් දාන ශාලාව, දෙමහල් ශිෂ්‍ය කේන්ද්‍රීය මධ්‍යස්ථානය සහ ශිෂ්‍ය නේවාසිකාගාරය සඳහා මුල්ගල් තැබීම වෙනුවෙන් 2016 නොවැම්බර් 04 දින ලංකාදීප පුවත්පතේ පිටුවක දැන්වීමක් පළකිරීම සඳහා රු. 327,750 ක මුදලක් වැය කර තිබුණි.

# 5 තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්සීපී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය සහ තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව විශ්වවිද්‍යාලය විසින් තම විෂයපථයට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එකී කාර්යයන් සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගෙන නොතිබුණි.

# 6 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.1.1 ප්‍රසම්පාදනයන්

විශ්වවිද්‍යාලය සඳහා පිරිවැය රු.3,888,000 ක් වූ වානේ තට්ටු ඇඳන් 140 ක් සඳහා ලංසු කැඳවීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.13 ඡේදය ප්‍රකාරව රු.40,000 ක ලංසු ඇපකරයක් ලබාගත යුතු වුවත් මෙයට අදාලව රු.4,000 ක ලංසු ඇපකරයක් පමණක් ලබාගෙන තිබුණි. එමෙන්ම වානේ තට්ටු ඇඳන් සැපයීම සඳහා අවම මිල ඉදිරිපත් කළ ලංසුකරුට කොන්ත්‍රාත්තුව පිරිනැමීමෙන් පසු ඔහු භාණ්ඩ සැපයීම ප්‍රතික්ෂේප කර මිල ඉහළ නංවා ගැනීමට උත්සාහ දරා තිබූ අතර පසුව ඔහු ඇණවුම ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ අනුව ප්‍රමාණවත් ලංසු සුරක්ෂණයක් ලබා නොගැනීම හේතුවෙන් ඇණවුම ප්‍රතික්ෂේප කළ ලංසුකරුගෙන් අයකරගත හැකි වූ ලංසු සුරක්ෂණයේ වටිනාකම රු.4,000 කට සීමා වූ අතර, ඔහුගෙන් අවම මිලට භාණ්ඩ මිලදී ගැනීමට තිබූ අවස්ථාව ද අහිමි වී තිබුණි.

### 6.1.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

---

විශ්වවිද්‍යාලයේ “යෝජිත තාප්පය හා පිවිසුම් මාර්ගය ඉදිකිරීම” (අදියර II ) කොන්ත්‍රාත්තුවේ පිවිසුම් මාර්ගය ඉදිකිරීම සම්බන්ධව 2018 පෙබරවාරි 22 දින සිදුකළ භෞතික පරීක්ෂාවේ දී ගල්තාර ඇතිරීම වැඩවිෂයට අදාලව ලබාගන්නා ලද නියැදි වල ඝණත්වයේ සාමාන්‍ය 31.5mm වූ අතර එය මාර්ගයේ ඇස්තමේන්තුගත ඝණත්වය වූ 40mm සමඟ සැසඳීමේදී විචලනය 8.5mm විය. එමෙන්ම පර්යේෂණාගාරයෙන් ලබා ගන්නා ලද පරීක්ෂණ වාර්තාව අනුව නියැදි වල තදවීම (Compaction) සියයට 90 ත් සියයට 96 ත් අතර වුවත් “Marshall Density” එකට සාපේක්ෂව එය සියයට 97 ට වඩා නොඅඩු විය යුතු බැවින් එම නියැදි අසමත් මට්ටමක පවතින බව පරීක්ෂණ වාර්තා අනුව තහවුරු විය. එමෙන්ම මාර්ගයේ වර්ගමීටර 348.29ක් සඳහා රු.1,692,689 ක් තත්ව පරීක්ෂණ වාර්තා (ඝණකම පිළිබඳ, තදවීම පිළිබඳ) ලබා නොගෙන 2017 නොවැම්බර් 13 දින ගෙවීම් කර තිබුණි.

## 7 පද්ධති හා පාලනයන්

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මහෝපාධ්‍යායන් වහන්සේගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකල යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ප්‍රසම්පාදන කටයුතු | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව වැඩ හා සැපයුම් සම්බන්ධ කොන්ත්‍රාත් පරිපාලන කටයුතු සිදු නොකිරීම. |
| (ආ) වාහන පාලනය | ධාවන සටහන් පොත්, ලොග් සටහන් පොත් යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) කලමනාකරණ කටයුතු | අධ්‍යයන කටයුතු ඇගයීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා නොතිබීම. |